## 13. ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

-------------------------------------------------------------

### 13.1 විගණන විෂය පථය

-----------------------

මානව හිමිකම් කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 ඔක්තොබර් 30 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 13.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 13.3 විගණන නිරීක්ෂණය

------------------------

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ පහත 13.4 සිට 13.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## 13.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 13.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පිඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් සභාව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 13.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 13.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 13.5 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | කොමිෂන් සභාවේ වාහනවලට සිදු වූ අනතුරු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණයන් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එක් එක් ස්ථාවර වත්කම් විෂයට අදාලව එහි පිරිවැය හැඳින්වීම, අත්පත් කර ගත් දිනය, පිහිටීම ආදී සම්පූර්ණ විස්තර සහිතව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ | |
| 2004 ජනවාරි 26 දිනැති හා අංක 2004/පුස/1 දරන චක්‍රලේඛය | සභාවේ පුස්තකාලයේ අස්ථානගත වී තිබූ පොත් 74 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 13.6 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී විමර්ශනයට භාජනය විය යුතු මුළු පැමිණිලි සංඛ්‍යාව 6,372 ක් වූ අතර වර්ෂය අවසාන වන විට විමර්ශනය කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 2,462 ක් වූයෙන් වර්ෂය අවසාන වන විට තවදුරටත් විමර්ශනය අවසන් නොවූ පැමිණිලි සංඛ්‍යාව 3,910 ක් විය.

## 13.7 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

2009 නොවැම්බර් 24 දිනැති අංක DMS/A/08/03/I/TEM දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව කොන්ත්‍රාත් හා අනියම් වැටුප් ලබන සේවකයන්ට, වැටුපට අමතරව ගෙවනු ලබන සියයට 25 දීමනාවට හිමිකම් නොමැති වුවද එම උපදෙස්වලට පටහැනිව 2012 වර්ෂයේදී කොන්ත්‍රාත් හා අනියම් සේවකයන් 08 දෙනෙකුට සියයට **25** දීමනාව ලෙස රු.303,198 ක මුදලක් ගෙවා තිබුණි.

## 13.8 කලමනාකරණ දුර්වලතා

පරීක්ෂා කරන ලද පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් කිසිදු අධ්‍යාපන සහතිකයක් අදාල ආයතන මගින් සනාථ කරවාගෙන නොතිබුණි.

## 13.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

(අ) 2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක විස්තර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 20 | 15 | - |
| (ආ) තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (ඇ) ද්විතීක මට්ටම | 105 | 105 | - | - |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 52 | 53 | - | 01 |
| (ඉ) වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත්) | - | 08 | - | 08 |
| එකතුව | 195 | 187 | 17 | 09 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 17 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 ජූනි 30 දිනැති අංක DMS/E2/01/3/383/1 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 195 ක් වූ අතර 2013 අගෝස්තු මාසය වන විටත් ආයතනයේ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරගෙන නොතිබුණි. එසේ තිබියදීත් 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් පදනමින් සිටි සේවකයන් 04 ක් හා අනියම් පදනමින් සිටි සේවකයන් 37 දෙනෙකු 2011 අගෝස්තු 01 දින වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. සේවයේ ස්ථිර කරනු ලබන නිලධාරීන්ට යම් වැටුප් තලයකට අදාලව මාසික වැටුපක් ගෙවිය යුතු වුවත් මෙම නිලධාරීන් සියළු දෙනාටම ස්ථිර කිරීමට පෙර ගෙවන ලද කොන්ත්‍රාත් හා අනියම් වැටුප දිගින් දිගටම ගෙවා ඇති බව විගණනයේදී අනාවරණය විය.